විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

**වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටුව ශ්‍රී ලංකාවේ සංචාරයක**

වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටුව (SPT) 2026 ජුනි 15 වැනි දින සිට 24 වැනි දා දක්වා ශ්‍රී ලංකාව වෙත සිය දෙවැනි සංචාරය සිදු කිරීමට නියමිතව ඇත.

ශ්‍රී ලංකාව, 2017 දෙසැම්බර් මාසයේදී, වධහිංසාවට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටෝකෝලයට (OPCAT) ඇතුළත් වීමෙන් අනතුරුව, වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටුව සිය පළමු ශ්‍රී ලංකා සංචාරය 2019 අප්‍රේල් මාසයේදී සිදු කළේය. එයට ඇතුළත් වන අවස්ථාවේදී, ශ්‍රී ලංකා රජය විසින්, වධහිංසාවට එරෙහි සම්මුතියේ විකල්ප ප්‍රොටෝකෝලය යටතේ ජාතික වධහිංසා වැළැක්වීමේ යාන්ත්‍රණය (NPM) ලෙස, "ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL)" පත් කරන ලදී.

එළඹෙන සංචාරයේදී, සිව් දෙනෙකුගෙන් යුත් වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටුවේ නියෝජිත පිරිස විසින් අමාත්‍ය මට්ටමින් රැස්වීම් පවත්වනු ඇති අතර, රජයේ අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සම්බන්ධ වනු ඇත. නියෝජිත පිරිස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ නියෝජිතයින් සහ සිවිල් සමාජ සාමාජිකයින් ද හමුවනු ඇත.

ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ අඛණ්ඩව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, විවෘත, නිර්මාණාත්මක සහ විනිවිද පෙනෙන ආකාරයකින් අනුකමිටුව සමඟ කටයුතු කරනු ඇති අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, අදාළ ජාත්‍යන්තර ලේඛන සම්බන්ධයෙන් ඇති සිය සම්මුතිගත බැඳීම් ස්වේච්ඡාවෙන් ඉටු කරනු ඇත.

නියෝජිත පිරිසට, අයිෂා ෂුජුන් මුහම්මද් (නියෝජිත පිරිසේ ප්‍රධානී-මාලදිවයින); යාකුබ් ජූලියන් වෙපෙක් (පෝලන්තය); අනිකා ටොම්සික් (ක්‍රොඒෂියාව); සහ නීකා ක්වාරට්ස්කෙලියා (ජෝර්ජියාව) ඇතුළත් වේ. ඔවුන් සමඟ ස්විට්සර්ලන්තයේ ජිනීවා හි වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටු ලේකම් කාර්යාලයේ නිලධාරීන් ද මෙරටට පැමිණෙනු ඇත.

වධහිංසා වැළැක්වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අනුකමිටුව විසින් මෙම සංචාරය ඔවුන් සතු බලතල අනුව සිදු කෙරේ.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

2026 ජුනි 12 වැනි දින


| | | | |
|---|---|---|---|
| **Foreign Affairs**<br>විදේශ කටයුතු<br>வெளிநாட்டு அலுவல்கள் | **Republic Building, Colombo 1**<br>ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1<br>குடியரசுக் கட்டிடம், கொழும்பு 1 | 2 325 373/5, 2 207 200/7 | cypher@mfa.gov.lk |
| **Foreign Employment**<br>විදේශ රැකියා<br>வெளிநாட்டு வேலைவாய்ப்பு | **17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**<br>17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5<br>17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5 | 2 331 200 | info@mfe.gov.lk |
| **Tourism**<br>සංචාරක<br>சுற்றுலாத்துறை | **No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**<br>අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1<br>இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1 | 2 381 798, 2 321 222 | secretary@tourismmin.gov.lk |